සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

| | | |
|---|---|---|
| කෘෂි තාක්ෂණවේදය I<br>விவசாயத் தொழினுட்பவியல் I<br>Agro Technology I | 18 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** මෘදු තාක්ෂණයේ භාවිතයක් විස්තර කිරීම සඳහා උචිත උදාහරණයක් තෝරන්න.
(1) නව පන්නයේ ඉස්කුරුප්පු නියනක් නිෂ්පාදනය කිරීම.
(2) පාන් නිෂ්පාදනය සඳහා සරල දැව පෝරණුවක් භාවිත කිරීම.
(3) මධ්‍යසාර පැසවීම සඳහා නව යීස්ට් දර්ශයක් බිහි කිරීම.
(4) කාබනික පොහොර නිෂ්පාදනයට නව ක්‍රමයක් හඳුන්වා දීම.
(5) ජල සම්පාදනයේදී ඉලෙක්ට්‍රොනික පාංශු තෙතමන සංවේදකයක් භාවිත කිරීම.

**2.** පැතුරුම්පත් මෘදුකාංගය වඩාත් සුදුසු වන්නේ
(1) පාරිභෝගිකයින්ට ලිපි ලිවීමට ය.
(2) රැස්වීමකදී ප්‍රගතිය ඉදිරිපත් කිරීමට ය.
(3) යෙදවුම් මෘදුකාංගයක් ක්‍රමලේඛනය (programming) කිරීමට ය.
(4) වෙබ් අඩවි නිර්මාණයට සහ වෙබ් පිටු නඩත්තු කිරීමට ය.
(5) දත්ත වගුගත කිරීම සහ ප්‍රස්තාරගත කිරීමට ය.

**3.** පහත ප්‍රකාශ සලකන්න.
A - ප්‍රෝටීන-ශක්ති ඌනපෝෂණය නිසා ගලගණ්ඩ තත්ත්වය ඇති විය හැකි ය.
B - මඤ්ඤොක්කා සහ බණ්ඩක්කා ගොයිට්‍රජන් අඩංගු ආහාර සඳහා උදාහරණ වේ.
C - ගලගණ්ඩය ඇති වීම වළක්වා ගැනීම සඳහා මුහුදෙන් ලබා ගන්නා ආහාර උපකාරී වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන්
(1) A පමණක් සත්‍ය වේ.
(2) B පමණක් සත්‍ය වේ.
(3) C පමණක් සත්‍ය වේ.
(4) A සහ B පමණක් සත්‍ය වේ.
(5) B සහ C පමණක් සත්‍ය වේ.

**4.** ප්‍රෝටීන පිළිබඳ **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) සියලු එන්සයිම ප්‍රෝටීන වේ.
(2) ප්‍රෝටීනවල ද්විතීයික ව්‍යුහය ඉහළ උෂ්ණත්වවලදී අස්වාභාවීකරණය වේ.
(3) ප්‍රෝටීන පොලිපෙප්ටයිඩ වේ.
(4) ප්‍රෝටීන අතුරෙන් යම් ප්‍රමාණයක් මිනිස් සිරුර තුළදී මේද බවට පත්වේ.
(5) යූරියා යනු ප්‍රෝටීන පරිවෘත්තියේ එක් අතුරුඵලයකි.

**5.** මුඩුවීම සඳහා හේතුවන එන්සයිමයක් හෝ එන්සයිම කාණ්ඩයක් වන්නේ
(1) ලයිපේස් ය.
(2) ඇමයිලේස් ය.
(3) කැටලේස් ය.
(4) පෙප්ටිඩේස් ය.
(5) පොලිෆීනෝල් ඔක්සිඩේස් ය.

[දෙවැනි පිටුව බලන්න

**6.** ආහාර සැකසීමේදී යොදා ගනු ලබන ක්ෂුද්‍රජීවියෙකු වන්නේ

(1) *Bacillus cereus* ය.
(2) *Staphylococcus aureus* ය.
(3) *Lactobacillus bulgaricus* ය.
(4) *Clostridium perfringens* ය.
(5) *Clostridium botulinum* ය.

**7.** පහත දෑ සලකන්න.

A - ගෙවතු වගාව
B - නැවුම් එළවළු සහ පලතුරු අතිරික්තය
C - වෙළඳපොළේ ප්‍රමාණවත් ආහාර පැවතීම
D - ප්‍රමාණවත් පවුලේ ආදායම

ඉහත දෑ අතුරෙන් ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ධනාත්මකව බලපෑ හැකි සාධක වන්නේ

(1) A සහ B පමණි.
(2) C සහ D පමණි.
(3) A, C සහ D පමණි.
(4) B, C සහ D පමණි.
(5) A, B, C සහ D සියල්ල ම.

**8.** පාංශු පැතිකඩක, C කලාපය සමන්විත වන්නේ

(1) පෝෂක බහුලව අඩංගු හියුමස්වලිනි.
(2) අර්ධ වශයෙන් ජීරණය වූ පාෂාණවලිනි.
(3) හියුමස්, මැටි සහ ඛනිජවලින් සෑදුණු පස්වලිනි.
(4) මැටි සහ අනෙකුත් ඛනිජ අඩංගු උප පසෙනි.
(5) පත්‍ර සහ අනෙකුත් ශාක ද්‍රව්‍ය ලිහිල්ව බැඳුණු ස්ථරයකිනි.

**9.** භූමි හායනය වඩාත් නිවැරදිව පිළිබිඹු වන පිළිතුර තෝරන්න.

(1) භූමියෙන් මතුපිට පස් ඉවත් කිරීම.
(2) පස මතුපිටින් ශාක වැස්ම ඉවත් කිරීම.
(3) භූමියේ ආර්ථික ඵලදායීතාවය හානි වීම.
(4) මානව බලපෑම් හේතුවෙන් භූමියේ ජෛව විද්‍යාත්මක නිෂ්පාදකතාවය පහත වැටීම.
(5) ස්වාභාවික හෝ මානවයා විසින් ප්‍රේරණය කරන ලද ක්‍රියාවලි මගින් භූමියට සිදුවන අහිතකර බලපෑම්.


**10.** පහත ප්‍රකාශ සලකන්න.

A - අභිජනන බීජ යනු උපරිම පාරිශුද්ධත්වයකින් යුත් නව ප්‍රභේදයක බීජ වේ.
B - අභිජනන බීජවල පළමු පරම්පරාව මූලික බීජ වේ.
C - සහතික කරන ලද බීජවල පළමු පරම්පරාව ලියාපදිංචි කළ බීජ වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A සහ B පමණි.
(5) B සහ C පමණි.

**11.** පහත දී ඇති A, B, C සහ D යන රූපවලින් සුලභව භාවිත කරන බද්ධ ක්‍රම හතරක් දක්වා ඇත.



A B C D

ඉහත බද්ධ ක්‍රම නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | A : පැලැස්තර බද්ධය, | B : H - බද්ධය, | C : T - බද්ධය | සහ | D : චිප් බද්ධය |
| (2) | A : චිප් බද්ධය, | B : පැලැස්තර බද්ධය, | C : T - බද්ධය | සහ | D : H - බද්ධය |
| (3) | A : පැලැස්තර බද්ධය, | B : චිප් බද්ධය, | C : T - බද්ධය | සහ | D : H - බද්ධය |
| (4) | A : T - බද්ධය, | B : චිප් බද්ධය, | C : H - බද්ධය | සහ | D : පැලැස්තර බද්ධය |
| (5) | A : චිප් බද්ධය, | B : H - බද්ධය, | C : T - බද්ධය | සහ | D : පැලැස්තර බද්ධය |

12. පහත ප්‍රකාශ සලකන්න.

A - තේක්ක (*Tectona grandis*) බීජවල සුප්තතාවය ඉවත් කිරීමට වඩාත් කාර්යක්ෂම ක්‍රමය වන්නේ 30 °C ජලයේ පැය 2ක් ගිල්වා තැබීමයි.

B - තේක්ක බීජවල ප්‍රරෝහණය ප්‍රමාදවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ එහි ඇති කලල සෛල ගුණනය වීමට ප්‍රමාණවත් තරම් මෘදු නොවන ඝන බාහිරාවරණයක් පැවතීමයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ.
(2) B සත්‍ය වන අතර, A අසත්‍ය වේ.
(3) A සහ B යන දෙකම සත්‍ය වේ.
(4) A සත්‍ය වන අතර, B මගින් එය වඩාත් පැහැදිලි කරනු ලබයි.
(5) B සත්‍ය වන අතර, A මගින් එය වඩාත් පැහැදිලි කරනු ලබයි.

13. ඖෂධීය ශාක කිහිපයක් පහත දැක්වේ.

A - ආඩතෝඩ
B - කොතල හිඹුටු
C - කටුපිල

ඉහත දැ අතුරෙන් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ සුලබව හමුවන ශාක/ය වන්නේ

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

14. ඖෂධීය ශාකයක් වන අක්කපාන (*Kalanchoe pinnata*) භාවිත කරනුයේ

(1) උගුරේ ආසාදනයන්ට ප්‍රතිකාර කිරීමට ය.
(2) වකුගඩු ආශ්‍රිත ගල්වලට ප්‍රතිකාර කිරීමට ය.
(3) අධිරුධිර පීඩනයට ප්‍රතිකාර කිරීමට ය.
(4) පණු ආසාදනයන්ට ප්‍රතිකාර කිරීමට ය.
(5) දියවැඩියා රෝගයට ප්‍රතිකාර කිරීමට ය.

15. කොරල් පරිසර පද්ධතියට හානි කරමින් එම පරිසරයෙන් බැහැරව සිදුවන විනාශකාරී ක්‍රියාකාරකමක් වන්නේ

(1) හිරිගල් කැණීමයි. (2) වැලි ගොඩදැමීමයි.
(3) මතුපිට අපදාවයයි. (4) සමුද්‍ර ආම්ලිකරණයයි.
(5) මුහුදු යාත්‍රා නැංගුරම් ලෑමයි.

16. වියළීම යනු කෘෂිකාර්මික ද්‍රව්‍ය පරිරක්ෂණය කිරීමට සුලභව භාවිත වන ක්‍රමයකි. වියළීම මගින් පරිරක්ෂණය සිදුවන්නේ

(1) විෂබීජහරණය වන බැවිනි.
(2) තාප ප්‍රතිකාරයක් සිදුවන බැවිනි.
(3) ව්‍යාධිජනකයින් විනාශවන බැවිනි.
(4) තෙතමනය අඩු කිරීම තුළින් ජෛව රසායනික ක්‍රියාකාරකම් අඩු වීම මගිනි.
(5) වියළි ද්‍රව්‍ය මත ක්ෂුද්‍ර ජීවීන්ට පැවතිය නොහැකි බැවිනි.

17. දීර්ඝතම කාලයක් කිරි කල් තබා ගත හැක්කේ

(1) ජීවානුහරණය මගිනි. (2) ශීතනය මගිනි.
(3) අධි ශීතනය මගිනි. (4) පැස්ටරීකරණය මගිනි.
(5) පරිරක්ෂක යෙදීම මගිනි.

18. ක්ෂුද්‍රජීවී පැසවීම භාවිතයෙන් සකසන්නේ

(1) සෝයාමීට් ය. (2) බීර ය. (3) අයිස්ක්‍රීම් ය. (4) උම්බලකඩ ය. (5) රටකජු බටර් ය.

19. "ශදුඅත (SWOT) විශ්ලේෂණයක්" වඩාත් උචිත වන්නේ, ආයතනයක

(1) උපායමාර්ග සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා ය.
(2) වාර්ෂික අය වැය සැකසීම සඳහා ය.
(3) පසුගිය වසරේ ප්‍රගතිය ඇගයීම සඳහා ය.
(4) භාණ්ඩ මිල දී ගැනීම සඳහා ය.
(5) නව නිෂ්පාදනයකට ඉන්ද්‍රිය ගෝචරතා ඇගයීම (sensory evaluation) සඳහා ය.

[හතරවැනි පිටුව බලන්න

**20.** ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක කිහිපයක් වන්නේ
(1) ශ්‍රම අවශ්‍යතාවය, දේශපාලන ස්ථාවරත්වය සහ පාරිභෝගිකයාගේ පවුල් පසුබිමයි.
(2) ශ්‍රම අවශ්‍යතාවය, වෙළඳපොළ සහ පවත්නා තාක්ෂණයයි.
(3) ආගමික සාධක, තරගකාරීන් සහ නිෂ්පාදනයට ඇති ඉල්ලුමයි.
(4) උගත් මානව සම්පත්වල සුලභතාවය, ප්‍රාග්ධන ආයෝජනය සහ සාමාජයීය සාධකයි.
(5) මූල්‍ය ප්‍රභව, නවීන තාක්ෂණයේ සුලභතාවය සහ කළමනාකරණ නිපුණතාවයි.

**21.** වර්ෂයක් තුළදී එක්තරා පැළ තවානකින් පහත දත්ත වාර්තා විය.

| | |
|---|---|
| ප්‍රාග්ධන ආයෝජනය | රුපියල් මිලියන 4 |
| වැටුප් සහ වේතන | රුපියල් මිලියන 1 |
| අනෙකුත් වියදම් | රුපියල් මිලියන 1 |
| වාර්ෂික ක්ෂය වීම් | රුපියල් මිලියන 0.5 |
| සියලුම විකුණුම්වලින් ලැබූ ආදායම් | රුපියල් මිලියන 3.5 |

ඉහත පැළ තවානේ වාර්ෂික ශුද්ධ ලාභය විය යුත්තේ, රුපියල් මිලියන
(1) 0.1 කි. (2) 0.5 කි. (3) 1.5 කි. (4) 2.5 කි. (5) 3.0 කි.

**22.** කෘෂිකර්මාන්තයේ තාක්ෂණික බිඳවැටීම් සඳහා ඇති අවදානම අඩු කළ හැකි වන්නේ
(1) සුදුසු ප්‍රතිකර්ම යොදා ගැනීම මගිනි.
(2) සාම්ප්‍රදායික දැනුම සමඟ බද්ධ වීම මගිනි.
(3) භාවිත කරන්නන් පුහුණු කිරීම සහ ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම මගිනි.
(4) කෘෂිකාර්මික නිෂ්පාදන පද්ධති සඳහා පවතින තාක්ෂණය යොදා ගැනීමෙන් වැළකීම මගිනි.
(5) මානවයා සමඟ ඍජු අන්තර්ක්‍රියා රහිත අංශවලට තාක්ෂණය භාවිත කිරීම මගිනි.

**23.** ගෝලීය හරිතාගාර වායු විමෝචනයට ඉහළම දායකත්වය දක්වන කර්මාන්තයක් වනුයේ
(1) ජලවිදුලිබල ජනනයයි.
(2) වානේ නිෂ්පාදනයයි.
(3) සිමෙන්ති නිෂ්පාදනයයි.
(4) ප්ලාස්ටික් නිෂ්පාදනයයි.
(5) ගොවිපළ සතුන් පාලනයයි.

**24.** පහත ප්‍රකාශ සලකන්න.
A - හිරු එළියෙන් මාළු වියළා, කරවල සෑදීම මෘදු තාක්ෂණයේ භාවිතයට උදාහරණයකි.
B - නව පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කිරීම මෘදු තාක්ෂණයට උදාහරණයකි.
C - වාරි පද්ධතියක් එකලස් කිරීම දෘඪ තාක්ෂණයට උදාහරණයකි.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි.
(4) B සහ C පමණි. (5) A, B සහ C සියල්ල ම.

**25.** ජෛව සම්පත් කිහිපයක් පහත දැක්වේ.
A - දහයියා
B - ලී කුඩු
C - ගොම
D - ඉඳුල්
ඉහත ද්‍රව්‍ය අතුරෙන් ජීව වායු නිෂ්පාදනය සඳහා ඍජුවම භාවිත කළ හැකි වන්නේ
(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) B සහ C පමණි.
(4) B සහ D පමණි. (5) C සහ D පමණි.

**26.** ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සංවර්ධනය සඳහා නව තාක්ෂණය භාවිතය සීමාකාරී වීමට බලපාන පාරිසරික සාධකයක් වන්නේ
(1) වෙනස් වන දිවා දිග වේ.
(2) සූර්ය විකිරණය වේ.
(3) වර්ෂාපතනයේ අනපේක්ෂිත වෙනස්වීම් වේ.
(4) වෙනස්වන ආලෝක තීව්‍රතාවය වේ.
(5) සුළං දිශාව වේ.


**27.** අවම බිම් සැකසීමේ සීමාකාරීකමක් වන්නේ
(1) බීජ ප්‍රරෝහණය අඩුවීමයි.
(2) අධික පාංශු බාදනයයි.
(3) අධික පාංශු සුසංහනයයි.
(4) අධික වාෂ්පීකරණයයි.
(5) අධික ඇතුල්කාන්දුවයි.

**28.** අතුරු යත් ගෑම සඳහා භාවිත වන උපකරණයක් වන්නේ
(1) තැටි පෝරුව ය.
(2) චොපින් හෝව ය.
(3) කොකු නගුල ය.
(4) හැඩ ලෑලි නගුල ය.
(5) තැටි නගුල ය.

**29.** වැලිමය පසකට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමෙන්
(1) පස සුසංහනය වේ.
(2) සුළං බාදනය ඉහළ යයි.
(3) දෘෂ්‍ය ඝණත්වය වැඩි වේ.
(4) කැටායන හුවමාරු ධාරිතාව අඩු වේ.
(5) ජලය රඳවා ගැනීමේ ධාරිතාව වැඩි වේ.

**30.** කෘෂිකාර්මික ඉඩම්වල පාංශු සුසංහනය ප්‍රධාන වශයෙන් ගැටලුවක් බවට පත්ව ඇත්තේ
(1) කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය නිසා ය.
(2) ඒක බෝග වගාව සිදු කිරීම නිසා ය.
(3) සතුන් මගින් ක්‍රියාකරන උපකරණ භාවිතය නිසා ය.
(4) අධි බරැති යන්ත්‍රෝපකරණ භාවිතය නිසා ය.
(5) ජල සම්පාදනය සඳහා ලවණ ජලය භාවිතය නිසා ය.

**31.** දී ඇති උපකරණය භාවිත වන ජලසම්පාදන ක්‍රමය වන්නේ
(1) උපපෘෂ්ඨීය ජල සම්පාදනය ය.
(2) බේසම් ජල සම්පාදනය ය.
(3) මතුපිට ජල සම්පාදනය ය.
(4) පිටාර ජල සම්පාදනය ය.
(5) බිංදු ජල සම්පාදනය ය.



**32.** බේසම් ජල සම්පාදනය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - විසිරුම් ජල සම්පාදනය හා සැසඳීමේදී ඒ සඳහා අවශ්‍ය වන ජල ප්‍රමාණය අඩු ය.
B - එය පලතුරු උයන්වල බහුලව භාවිත වේ.
C - එය වී වගාවේදී භාවිත වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ
(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A සහ B පමණි.
(5) B සහ C පමණි.

**33.** බෝග ක්ෂේත්‍රයක පසේ ජලවහනය වැඩි කිරීම සඳහා සුදුසු ක්‍රියාව තෝරන්න.
(1) පිටාර ජල සම්පාදනය භාවිත කිරීම
(2) උපපස් නගුලක් භාවිතය මගින් පසේ දෘඪස්ථරය (hardpan) බිඳ දැමීම
(3) ද්විතීයික බිම් සැකසීම සඳහා කොකු නගුලක් භාවිත කිරීම
(4) බිම් සැකසීම සඳහා අධි බරැති යන්ත්‍රෝපකරණ භාවිත කිරීම
(5) ශුන්‍ය බිම් සැකසීම අනුගමනය කිරීම

**34.** පහත ප්‍රකාශ සලකන්න.

A - කුඹුරුවල ඇසොල්ලා වගා කිරීම මගින් යූරියා යෙදීම අඩුකළ හැකි ය.

B - ඇසොල්ලාවල වායුගෝලීය නයිට්‍රජන් තිර කරනු ලබන *Anabaena azollae* නම් සයනොබැක්ටීරියාව පවතී.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A සහ B දෙකම සත්‍ය වේ.

(2) A සත්‍ය වන අතර, B අසත්‍ය වේ.

(3) B සත්‍ය වන අතර, A අසත්‍ය වේ.

(4) A සත්‍ය වන අතර, B මගින් එය වඩාත් පැහැදිලි කෙරේ.

(5) B සත්‍ය වන අතර, A මගින් එය වඩාත් පැහැදිලි කෙරේ.

**35.** පහත ප්‍රකාශ සලකන්න.

ජෛව අඟුරු විස්තර කළ හැක්කේ

A - පසක කෘෂිකාර්මික සහ පාරිසරික වටිනාකම තිරසාර ලෙස දියුණු කිරීම සඳහා උචිත ප්‍රභවවලින් ලබාගත් නයිට්‍රජනීය ජෛව ස්කන්ධ ලෙස ය.

B - ශාක වර්ධනය වනවිට ලබාගැනීම සඳහා පසේ ඇති ජලය හා පෝෂක රඳවා තබාගැනීමට උපකාර වන සච්ඡිද්‍ර ද්‍රව්‍යයක් ලෙස ය.

C - බැරලෝහ සහ පළිබෝධනාශක අචල තත්ත්වයට පත්කිරීමේ විභවයක් පැවතිය හැකි අධිශෝෂක ද්‍රව්‍යයක් ලෙස ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**36.** පහත ප්‍රකාශ සලකන්න.

A - උක් C3 ශාකයකි.

B - බඩ ඉරිඟු C3 ශාකයකි.

C - කුඹුරුවල තෘණමය වල්පැළෑටි අතුරෙන් බහුතරය C4 ශාක වේ.

D - C3 ශාක සමග සසඳන විට C4 ශාකවල පෝෂක භාවිත කාර්යක්ෂමතාව වැඩි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) C සහ D පමණි.

(4) A, C සහ D පමණි. (5) B, C සහ D පමණි.

**37.** ශාක පටකවලින් කිනක විකසනයට උපකාරී වන හෝමෝන වන්නේ

(1) ඇබ්සිසික් අම්ලය සහ ඔක්සීන වේ.

(2) සයිටොකයිනින් සහ එතිලීන් වේ.

(3) එතිලීන් සහ ගිබරලික් අම්ලය වේ.

(4) ඔක්සීන සහ සයිටොකයිනින් වේ.

(5) ඇබ්සිසික් අම්ලය සහ ගිබරලික් අම්ලය වේ.

**38.** බෝග ආරක්ෂණය (crop protection) පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ශ්‍රී ලංකාවේ වී වගාව සඳහා බහුලවම යොදාගනු ලබන කෘත්‍රිම පළිබෝධ නාශක වන්නේ කෘමිනාශක ය.

(2) වල්පැළෑටිවල ප්‍රතිරෝධීතාවය ගොඩනැගීම, අඛණ්ඩව වල්නාශක යෙදීම නිසා හටගන්නා ප්‍රධාන පාරිසරික ගැටලුවකි.

(3) කෘත්‍රිම පළිබෝධ නාශක භාවිතය ඒකාබද්ධ පළිබෝධ පාලනය කිරීමේ තාක්ෂණයට අයත් නොවේ.

(4) ශ්‍රී ලංකාවේ කුඹුරුවල තෘණ කුලයේ වල්පැළ මර්ධනය සඳහා ජෛව පාලකයන් බහුලව භාවිත වේ.

(5) ගෝලීය කෘෂිකර්මාන්තයේ බහුලවම යොදාගන්නා පළිබෝධ මර්ධන ක්‍රමය වන්නේ ජෛව පළිබෝධනාශක භාවිතයයි.

**39.** වල්නාශකයක් හොඳින්ම විස්තර කළ හැකි වන්නේ
(1) පළිබෝධනාශකයක් ලෙස ය.
(2) අකාබනික රසායන ද්‍රව්‍යයක් ලෙස ය.
(3) ශාක වර්ධක නිශේධකයක් ලෙස ය.
(4) පරිසර දූෂකයක් ලෙස ය.
(5) බහුජාතික සමාගම් මගින් නිපද වූ රසායනික ද්‍රව්‍යයක් ලෙස ය.

**40.** බෝඩෝ මිශ්‍රණය
(1) කොපර් හයිඩ්‍රොක්සයිඩ් සහ ලුණු මිශ්‍ර කිරීමෙන් ලබාගත් ද්‍රාවණයකි.
(2) කොපර් සල්ෆේට්, හුණු සහ ජලය සහිත මිශ්‍රණයකි.
(3) ප්‍රධාන වශයෙන් සතුන්ගේ බැක්ටීරියා ආසාදන මර්දනය සඳහා භාවිත කරයි.
(4) බෝගවල දිලීර රෝග මර්ධනය කිරීම සඳහා යොදාගන්නා කාබනික ද්‍රව්‍යයකි.
(5) වී වගාවේ භාවිත වන රෝග කළමනාකරණ තාක්ෂණයන්හි අත්‍යවශ්‍ය සංඝටකයකි.

**41.** පහත ප්‍රකාශ සලකන්න.
A - කෘමීන් ස්වසනයට රන්ද්‍ර භාවිත කරයි.
B - පිලා අවධිය කෘමියෙකුගේ ජීවන චක්‍රයේ සුප්ත අවධියකි.
C - ගැඩවිල් පණුවන්ගේ බහිස්‍රාවී ද්‍රව්‍ය, ගැඩවිල් කොම්පෝස්ට් ලෙස හඳුන්වයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් සත්‍ය වන්නේ
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A සහ B පමණි. (5) B සහ C පමණි.

**42.** ශ්‍රී ලංකාවේ උඩරට ප්‍රදේශ සඳහා පොලිතීන් උමං වඩාත් සුදුසු වන්නේ, උඩරට ප්‍රදේශවල
(1) වායුගෝලීය උෂ්ණත්වය අඩු නිසා ය.
(2) වර්ෂාපතනය වැඩි නිසා ය.
(3) සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩි නිසා ය.
(4) වලාකුළු වැස්ම වැඩි නිසා ය.
(5) සුළං මගින් සිදුවන බෝග හානි වැඩි නිසා ය.

**43.** පොලිතීන් උමං තුළ තක්කාලි වගාව සඳහා වඩාත් සුදුසු ජලසම්පාදන සහ පෝෂක සැපයීමේ ක්‍රමවේදය වන්නේ
(1) විසිරුම් ජල සම්පාදනයයි. (2) පිටාර ජල සම්පාදනයයි.
(3) බිංදු ජල සම්පාදනයයි. (4) උපපෘෂ්ඨීය ජල සම්පාදනයයි.
(5) මුට්ටි ජල සම්පාදනයයි.

**44.** පහත ඒවා අතුරෙන් යහපත් රෝපණ මාධ්‍යයකට යෝග්‍ය **නොවන** ලක්ෂණය තෝරන්න.
(1) බඳුන තුළ පහසුවෙන් මුල් ගමන් කිරීමට ඉඩ හැරීම
(2) රෝග සහ කෘමීන්ගෙන් තොරවීම
(3) මනා වාතනයක් සහ ජල වහනයක් පැවතීම
(4) මනා ජලය රඳවාගැනීමේ ධාරිතාවක් පැවතීම
(5) pH අගය 4.0-6.5 ක් වීම

**45.** ජෙරනියම් (Geranium) ශාකයේ මල්වල විශාලත්වය වැඩි කරන සහ ඇල්පයින් වයලට් (Alpine violet) ශාකයේ මල් හට ගැනීම වේගවත් කරන වර්ධක යාමකය වන්නේ
(1) ගිබරලික් අම්ලය ය. (2) ඇබ්සිසික් අම්ලය ය. (3) එතිලීන් ය.
(4) ඔක්සින් ය. (5) සයිටොකයිනින් ය.

**46.** ගොවිපළ සතුන් රෝමාන්තික සහ රෝමාන්තික නොවන ලෙස කාණ්ඩ දෙකකට බෙදනු ලබයි. මෙම කාණ්ඩගත කිරීම සිදු කරනු ලබන්නේ ඔවුන්ගේ
(1) ප්‍රයෝජනය අනුවයි.
(2) සම්භවය අනුවයි.
(3) දේහ ප්‍රමාණය අනුවයි.
(4) ප්‍රධාන නිෂ්පාදන ආකාරය අනුවයි.
(5) ආහාර පුරුදු සහ පෝෂණය අනුවයි.

[අටවැනි පිටුව බලන්න

**47.** පෝෂ තෘණ වර්ගයකට උදාහරණයක් වන්නේ

(1) බ්‍රැකේරියා ය. (2) නේපියර් ය. (3) පියුරේරියා ය. (4) සෝගම් ය. (5) ඇකේසියා ය.

**48.** කිකිළි බිත්තර බීජෞෂණය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ.

A - බීජෞෂණ ක්‍රියාවලිය අතරතුරදී සංසේචනය නොවූ බිත්තර ඉවත් කිරීම සඳහා ආලෝක පරීක්ෂාව (candling) සිදු කළ යුතු ය.

B - සාර්ථක බීජෞෂණයක් සඳහා බිත්තර හැරවීම දිනකට 24 වතාවක් සිදු කළ යුතු ය.

C - කිකිළියක් දැමූ ඕනෑම සංසේචිත බිත්තරයක් බීජෞෂණය සඳහා සුදුසු ය.

ඉහත ප්‍රකාශ අතුරෙන්

(1) A පමණක් නිවැරදි ය.
(2) B පමණක් නිවැරදි ය.
(3) C පමණක් නිවැරදි ය.
(4) A සහ B පමණක් නිවැරදි ය.
(5) B සහ C පමණක් නිවැරදි ය.

**49.** එළදෙනකගේ මද චක්‍රය, පෙර මදය, මදය, පසු මදය සහ මද අතුර ලෙස අවධි හතරකට බෙදා දැක්විය හැකි ය. ඒ අතුරෙන් ඩිම්බ මෝචනය සාමාන්‍යයෙන් සිදුවන්නේ

(1) පෙර මදයේදී ය.
(2) මදයේදී ය.
(3) පසු මදයේදී ය.
(4) මද අතුරේදී ය.
(5) පෙර මදය සහ මදය අතුරදී ය.

**50.** සත්ත්ව සම්භවයක් සහිත ආහාර පරිරක්ෂණය පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කිරි සහ මස් දෙවර්ගයම පෝෂක ගුණය ඉහළ නැංවීම සඳහා පරිරක්ෂණය සිදු කරයි.
(2) කිරි සහ මස් පරිරක්ෂණය සඳහා සැමවිටම පරිරක්ෂක එකතු කළ යුතු ය.
(3) කිරි විසිරි වියළීම ජීවානුහරණ ක්‍රියාවලියකි.
(4) පැස්ටරීකරණය සහ ජීවානුහරණය මගින් කිරිවල සියලුම ක්ෂුද්‍රජීවීන් විනාශ කරයි.
(5) ඕනෑම පරිරක්ෂණ ක්‍රමවේදයකදී මස් සහ කිරිවල පෝෂක ගුණය සැමවිටම අඩු කරයි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

**කෘෂි තාක්ෂණවේදය II**
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

**18 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය :** ....................................

**උපදෙස් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **09**කින් සහ ප්‍රශ්න **10**කින් සමන්විත වේ.

✳ මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** යනුවෙන් කොටස් **තුනකින්** සමන්විත වන අතර කොටස් **තුනට ම** නියමිත කාලය **පැය තුනකි.**

**A කොටස — ව්‍යුහගත රචනා (පිටු අංක 2-8)**

✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

✳ ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු **නො වන** බව ද සලකන්න.

**B කොටස සහ C කොටස — රචනා (පිටු අංක 9)**

✳ එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.

✳ සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

✳ ප්‍රශ්න පත්‍රයේ **B** හා **C** කොටස් පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |

**එකතුව**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

**සංකේත අංකය**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය කළේ | |

[දෙවැනි පිටුව බලන්න

## A - කොටස - ව්‍යුහගත රචනා

**සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය **100** කි.)

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

**1.** (A) කෘෂිකර්මයේදී තාක්ෂණික මැදිහත්වීම් මගින් ලැබිය හැකි පාරිසරික වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(B) පහත සඳහන් එක් එක් කාණ්ඩවලින් නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රයක් බැගින් ලියන්න.

(1) මුද්‍රිත මාධ්‍ය : ..............................

(2) ඉලෙක්ට්‍රොනික මාධ්‍ය : ..............................

(C) කාබෝහයිඩ්‍රේට අධික සමහර ආහාර පරිභෝජනයෙන් පසු රුධිරයේ සීනි මට්ටම ක්ෂණිකව ඉහළ **නොයාමට** හේතු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(D) පලා වර්ග පරිභෝජනයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(E) නරක්වීමට භාජනය වූ ආහාරවල දැකිය හැකි භෞතික වෙනස්කම් **හතරක්** ලැයිස්තුගත කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

(F) මිනිසාගේ දැකිය හැකි විටමින A ඌනතා ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(G) ආහාර පිරමීඩයක ඉහළම මට්ටමේ තිබිය යුතු ආහාර සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(H) එකම කන්නයේදී බහුතරයක් ගොවීන් එකම බෝගය වගා කිරීමෙන් ජාතික ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි බලපෑම් එල්ලවිය හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

[තුන්වැනි පිටුව බලන්න

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

2362

(I) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප **තුන** සඳහන් කර, ඒවායේ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය දක්වන්න.

| දේශගුණික කලාපය | සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය (මි.මී.) |
|---|---|
| (1) .............................................. | .............................................. |
| (2) .............................................. | .............................................. |
| (3) .............................................. | .............................................. |

(ii) ශ්‍රී ලංකාවේ ඇති කෘෂි දේශගුණික කලාප ගණන කීය ද? ..........................................

(J) පහත සඳහන් එක් එක් කෘෂි නිෂ්පාදන පරිරක්ෂණය සඳහා භාවිත කළ හැකි පාරම්පරික පරිරක්ෂණ ක්‍රමයක් බැගින් ලියන්න.

| කෘෂි නිෂ්පාදිතය | පාරම්පරික පරිරක්ෂණ ක්‍රමය |
|---|---|
| (1) වී | .............................................. |
| (2) මාළු | .............................................. |
| (3) කිරි | .............................................. |
| (4) මස් | .............................................. |

Q. 1

100

**2.** (A) ප්‍රරෝහණ ප්‍රතිශතය, බීජ ජීව්‍යතාවයේ ඇස්තමේන්තුවකි. රනිල බෝගයක බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය ඇගයීම සඳහා කරන ලද අධ්‍යයනයක ප්‍රතිඵල පහත වගුවෙහි දැක්වේ.

| අධ්‍යයනය ආරම්භයේ සිට දින ගණන | පෙට්‍රි දීසියේ ඇති මුළු ජීව්‍ය බීජ සංඛ්‍යාව | ප්‍රරෝහණය වූ බීජ සංඛ්‍යාව |
|---|---|---|
| 0 | 50 | 0 |
| 2 | 48 | 35 |
| 3 | 42 | 38 |
| 4 | 41 | 39 |
| 5 | 41 | 37 |
| 6 | 40 | 38 |

(i) ප්‍රරෝහණ ප්‍රතිශතය ගණනය කිරීමට සුදුසු සමීකරණයක් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

(ii) අධ්‍යයනයේ හයවන දින අවසානයේදී බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය ගණනය කරන්න.

..........................................................................................................


..........................................................................................................

(iii) රනිල බීජ ප්‍රරෝහණයට බලපාන අභ්‍යන්තර සාධකයක් ලියන්න.

..........................................................................................................

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(B) රනිල බෝගයක බීජවල ප්‍රරෝහණයේ *A*, *B*, *C* සහ *D* ලෙස අවධි පහත රූපයෙන් දැක්වේ.




රූපයේ දක්වා ඇති ප්‍රරෝහණ අවධි සඳහන් කරන්න.

*A* – ........................................ *B* – ........................................

*C* – ........................................ *D* – ........................................

(C) ඔසු උයනක් සඳහා සුදුසු පැළ තේරීමේදී සලකා බැලිය යුතු වැදගත් සාධක **දෙකක්** ලැයිස්තු ගත කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(D) ඔසු උයනකට හඳුන්වාදිය හැකි සාම්ප්‍රදායික **නොවන** ව්‍යූහ **තුනක්** නම් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(3) ........................................................................................................

(E) ඖෂධීය ශාක/නිෂ්පාදන සඳහා භාවිත කළ හැකි උචිත වියළීමේ ක්‍රමයක් නම් කරන්න.

........................................................................................................

(F) වාණිජ කෘෂිකර්මාන්තයේ භාවිත වන නවීන ජෛව තාක්ෂණික ක්‍රම සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

(G) පහත සඳහන් එක් එක් ව්‍යාපාර පවත්වාගෙන යන්නේ නිෂ්පාදන අරමුණු කරගෙන ද, සේවාවන් අරමුණු කරගෙන ද යන්න, වරහන් තුළ දී ඇති **වැරදි** පිළිතුර කපා හරිමින් සඳහන් කරන්න.

(1) වී නිෂ්පාදනය ඉහළ නැංවීම අරමුණු කොටගෙන වී ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (නිෂ්පාදන අරමුණු කරගත්/ සේවාවන් අරමුණු කරගත්).

(2) පලතුරු යුෂ නිෂ්පාදනය කිරීම සඳහා පලතුරු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම (නිෂ්පාදන අරමුණු කරගත්/ සේවාවන් අරමුණු කරගත්).

(H) ජෛව සම්පත් තාක්ෂණයට අදාළවන, සේවාවන් අරමුණු කරගත් ව්‍යාපාර සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ........................................................................................................

(2) ........................................................................................................

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(I) සාර්ථක ව්‍යාපාර කළමනාකරණයේ පියවර **හතර** සඳහන් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

(4) ..................................................................................................

(J) පහත සඳහන් එක් එක් තාක්ෂණික දියුණුවීම් හා බැඳුණු මානව සෞඛ්‍ය අවදානමක් බැගින් සඳහන් කරන්න.

(1) ආහාර ආකලක භාවිතය :

..................................................................................................

..................................................................................................

(2) කෘෂිකර්මාන්තයේදී ශාක පදනම් කරගත් පළිබෝධනාශක භාවිතය :

..................................................................................................

..................................................................................................

Q. 2

/100

**3.** (A) වාණිජ බෝග නිෂ්පාදනයේදී උචිත තාක්ෂණය භාවිතය වැදගත් වේ. පොසිල ඉන්ධන දහනයෙන් තොරව කෘෂිකර්මාන්තය සඳහා වාණිජව ජලය එසවීම හෝ පොම්ප කිරීමට භාවිත වන උචිත තාක්ෂණයන් **දෙකක්** ලැයිස්තුගත කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(B) පහත සඳහන් බිම් සකස් කිරීමේ එක් එක් අවධි සඳහා සුදුසු මෙවලමක් බැගින් නම් කරන්න.

(1) ප්‍රාථමික බිම් සැකසීම : ....................................................................

(2) ද්විතීයක බිම් සැකසීම : ....................................................................

(3) අතුරු යත් ගෑම : ....................................................................

(C) ප්‍රාථමික බිම් සැකසීමේ ප්‍රධාන අරමුණු **තුනක්** සඳහන් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

(D) බෑවුම් සහිත බිම් සඳහා භාවිත කරන සුදුසු ජෛවීය පාංශු සංරක්ෂණ ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

මෙම තීරයේ කිසිවක් නො ලියන්න


(E) දුර්වල ජලවහනයක් සහිත පසක ස්වාභාවිකව වැවෙන ශාකයක දක්නට ලැබෙන ගතිලක්ෂණ **තුනක්** ලියන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(3) ..................................................................................................

(F) පහත දක්වා ඇති ජලරෝපිත පද්ධතියයේ *A*, *B*, *C* සහ *D* ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න.




*A* – ........................................... *B* – ...........................................

*C* – ........................................... *D* – ...........................................

(G) ඉහත 3 (F) හි දක්වා ඇති ජලරෝපිත පද්ධතිය හැර, එළවළු වගාව සඳහා සුලභව භාවිත කරන ජලරෝපිත පද්ධති **දෙකක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(H) C3 ශාක, C4 ශාකවලින් වෙන්කර හඳුනාගැනීමට භාවිත වන ගති ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

(I) ශාකවල වර්ධක ප්‍රචාරණයේ වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** සඳහන් කරන්න.

| වාසි | | අවාසි | |
|---|---|---|---|
| (1) | ........................................ ........................................ | (1) | ........................................ ........................................ |
| (2) | ........................................ ........................................ | (2) | ........................................ ........................................ |

Q. 3

100

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

**4.** (A) කෘෂිකාර්මික භූමියක ඇති වාර්ෂික වල් පැළෑටි හා සැසඳීමේදී බහුවාර්ෂික වල් පැළෑටි පාලනය අපහසු වේ. බහුවාර්ෂික වල්පැළෑටිවල පැවැත්ම සඳහා දායක වන හේතු **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(B) බඩ ඉරිඟු වගාවක සේනා දළඹුවාගේ පැතිරීම පාලනයට, ශ්‍රී ලංකාවේ ගොවීන් භාවිත කරන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(C) "ඒකාබද්ධ ශාක රෝග කළමනාකරණය" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

..........

..........

(D) ආරක්ෂිත කෘෂිකර්මාන්තයේදී භාවිත වන වර්ධක මාධ්‍ය **දෙකක්** නම් කර, එම එක් එක් වර්ධක මාධ්‍ය සඳහා සුදුසු වන බෝගයක් හෝ ශාකයක් සඳහා උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

| වර්ධක මාධ්‍යය | | උදාහරණය (බෝගය හෝ ශාකය) | |
|---|---|---|---|
| (1) | .......... | (1) | .......... |
| (2) | .......... | (2) | .......... |

(E) කැපූ රෝසමල් වගාවක ප්‍රශස්ත අස්වනු නෙළීමේ අවධිය තීරණය කළ හැකි ප්‍රධාන සාධක **තුනක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(F) කැපූ රෝසමල් වගාවක වර්ධනයට සහ පුෂ්ප හටගැනීමට බලපාන ප්‍රධාන සාධක **තුනක්** සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(G) ශ්‍රී ලංකාවේ පවතින සත්ත්ව ආහාර සමහරක් පහත ලැයිස්තුවේ දක්වා ඇත.

සෝයා බෝංචි අන්නය, සහල් නිවුඩු, පොල් පුන්නක්කු, පිදුරු, බඩ ඉරිඟු, නැවුම් තෘණ, මත්ස්‍ය අන්නය සහ සිප්පිකටු කුඩු

ඉහත දැ අතුරෙන් පහත සඳහන් එක් එක් සත්ත්ව ආහාර කාණ්ඩ යටතට ගැනෙන ආහාරයක් බැගින් සඳහන් කරන්න.

| **සත්ත්ව ආහාර කාණ්ඩය** | | **සත්ත්ව ආහාරය** |
|---|---|---|
| (1) ශක්ති පරිපූරක | : | .................................................. |
| (2) ශාක ප්‍රෝටීන පරිපූරක | : | .................................................. |
| (3) ඛනිජ පරිපූරක | : | .................................................. |
| (4) වියළි දළ ආහාර | : | .................................................. |

(H) වාණිජ ගොවිපළවලට යැවීමට පෙර, අලුතින් බිහිවුණු කුකුළු පැටවුන් පිටලෑම සිදුකරයි. වාණිජ බිත්තර දමන කිකිළියන්ගේ ගොවිපළක් සඳහා කුකුළු පැටවුන් තේරීමේදී භාවිත කරන නිර්ණායක **තුනක්** සඳහන් කරන්න.

(1) ..................................................

(2) ..................................................

(3) ..................................................

(I) ගවයන්ගේ කලල මාරු ක්‍රියාවලියේදී භාවිත වන හෝර්මෝන **දෙකක්** නම් කරන්න.

(1) ..................................................

(2) ..................................................

(J) කිරි පැස්ටරීකරණය සහ ජීවානුහරණය අතර ඇති ප්‍රධාන වෙනස්කම් **තුනක්** සඳහන් කරන්න.

(1) ..................................................

(2) ..................................................

(3) ..................................................

Q. 4

100

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

කෘෂි තාක්ෂණවේදය II
விவசாயத் தொழினுட்பவியல் II
Agro Technology II

18 S II

## රචනා

* **B** සහ **C** යන කොටස්වලින් එක් කොටසකින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
* එක් ප්‍රශ්නයකට ලකුණු **150** බැගින් හිමි වේ.

## B කොටස

**1.** (i) ව්‍යාපාරයක සාර්ථක කළමනාකරණයක් සඳහා අන්තර්ජාලයේ භාවිත විස්තර කරන්න.
(ii) සමතුලිත ආහාර වට්ටෝරුවක් සැකසීමේදී ආහාර සංයුති වගුවල භාවිතය කෙටියෙන් විස්තර කරන්න.
(iii) පස සෑදීමේ ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.

**2.** (i) රටක ජාතික ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරගැනීම හා සම්බන්ධ ගැටලු විස්තර කරන්න.
(ii) නිෂ්පාදනයේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම පිණිස ගනු ලබන පියවර හුවාදක්වමින් ඖෂධීය ශාක එකක් හෝ කිහිපයක් භාවිත කර කොළ කැඳ සාදා ගැනීමේ ක්‍රියාවලිය විස්තර කරන්න.
(iii) ආහාර සහ කෘෂිකර්මාන්තයේදී ප්‍රතිසංයෝජන DNA තාක්ෂණයේ භාවිතය සඳහා ඇති විභවයන් පැහැදිලි කරන්න.

**3.** (i) ශ්‍රී ලංකාවේ පලතුරු බෝග සඳහා වැඩි දියුණු කරන ලද වර්ධක ප්‍රචාරණ ක්‍රම භාවිතයේ වැදගත්කම පැහැදිලි කරන්න.
(ii) ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන තෝරාගත් කුළුබඩුවක පසු අස්වනු හැසිරවීමේ සහ සැකසීමේ ක්‍රමවේද විස්තර කරන්න.
(iii) ජලජ පාරිසරික පද්ධතිවල තිරසාර භාවිතය තහවුරු කිරීම සඳහා සුදුසු කළමනාකරණ ක්‍රම විස්තර කරන්න.

## C කොටස

**4.** (i) වී වගාවේදී වැපිරීම හා සැසඳීමේදී පේළියට පැළ සිටුවීමේ වාසි විස්තර කරන්න.
(ii) පාංශු ආම්ලිකතාවය, භාස්මිකතාවය සහ බෝගවලට ඒවායේ ඇති බලපෑම පැහැදිලි කරන්න.
(iii) බිත්තර දමන කිකිළියන්ගෙන් යුත් වාණිජ ගොවිපළකට සැපයීම සඳහා සුදුසු දිනක් වයසැති කුකුළු පැටවුන් තේරීම සහ ප්‍රවාහනය කිරීම විස්තර කරන්න.

**5.** (i) තෝරාගත් බෝගයක් සඳහා ජල රෝපිත පද්ධතියක් ස්ථාපනය කරගන්නා ආකාරය විස්තර කරන්න.
(ii) ශ්‍රී ලංකාවේ මඩ වී වගාවට සුදුසු ඒකාබද්ධ වල්පැළෑටි කළමනාකරණ වැඩසටහනක් සංක්ෂිප්තව විස්තර කරන්න.
(iii) උපතේ සිට වසරක් දක්වා, වසු පැටවුන් සඳහා සුදුසු ආහාර දීමේ වැඩපිළිවෙළක් පැහැදිලි කරන්න.

**6.** (i) උඩරට එළවළු ගොවිපළක් සඳහා සුදුසු ඒකබාද්ධ ශාක පෝෂක කළමනාකරණ ක්‍රම විස්තර කරන්න.
(ii) අපනයන වෙළඳපොළ සඳහා කැපූ මල් සහ විසිතුරු පත්‍ර සැකසීමේදී සැලකිය යුතු සාධක විස්තර කරන්න.
(iii) පරිසර හිතකාමී බෝග නිෂ්පාදනයේ මූලික සිද්ධාන්ත පැහැදිලි කරන්න.

* * *